
**07 ශ්‍රේණිය - විද්‍යාව**

**08. පෘථිවියේ ස්වභාවය**

***නිවාඩු කාලීන ස්වයං අධ්‍යන කාර්ය පත්‍රිකා - 02***

1. සෞර ග්‍රහ මණ්ඩලයට අයත් රූපයක් ඔබට සපයා ඇත. එය හොඳින් අධ්‍යනය කර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




I. ඉහත රූපයේ දැක්වෙන ආකාරයට සෞර ග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහලෝක ගණන කියද?


II. සෞර ග්‍රහ මණ්ඩලයට අයත් ග්‍රහලෝක පිළිවෙළට නම් කරන්න.

III. සෞර ග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක අතුරින් මිනිසාට ජීවත් වීමට සුදුසුම ග්‍රහලෝකය ලෙස සලකන්නේ කුමන ග්‍රහයාද?

IV. අප අයත් වන ග්‍රහ ලෝකය නම් කරන්න.

V. එය පිහිටන්නේ කී වැනියාටද?

2. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය පහත පරිදි වේ.



I. හාෆ් ෂීට් කොලයක්, වර්ණ තුනකින් පාට පැන්සල් තුනක් , කවකට්ටක් ගෙන ඉහත ආකාරයට නිර්මාණය සිදු කරන්න.

II. ඔබේ නිර්මාණය හොඳින් අධ්‍යනය කරන්න.

III. පෘථිවියේ අභ්‍යන්තරය බෙදිය හැකි ප්‍රධාන ප්‍රදේශය තුනකි. ඒවා මොනවාද?

IV. ඒ අනුව පෘථිවියේ බාහිරම ප්‍රදේශය කුමක්ද?

V. කබොලට ඇතුලතින් ඇත්තේ කුමන ප්‍රදේශය ද?


VI. පෘථිවියේ ඇතුළතින්ම පිහිටා ඇති ප්‍රදේශය හඳුන්වන නම ලියන්න.

3. පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය ආදර්ශනයට අදාළ ක්‍රියාකාරකමක පියවර පහත දැක්වේ. එම ක්‍රියාකාරකමට අදාළ නිර්මාණය සිදු කරන්න.

අවශ්‍ය ද්‍රව්‍ය :- 35 cm × 35 cm පමණ කාඩ්බෝඩ් කැබැල්ලක්, වර්ණ තුනකින් පාට කර වේලා ගත් පොල් කුඩු හෝ ලී කුඩු හෝ සිහින් වැලි, ගම්

ක්‍රමය :-

- කාඩ්බෝඩ් කැබැල්ලේ හරි මැද 1 cm අරය සහිත වෘත්තයක් අඳින්න.
- එය සමග ඒක කේන්ද්‍රීය වන සේ 7 cm අරය සහිත වෘත්තයක් අඳින්න.
- එම වෘත්ත දෙකම ඒක කේන්ද්‍රීය වන සේ 13 cm අරය සහිත වෘත්තයක් අඳින්න.
- ඔබට පහත ආකාරයේ සටහනක් ලැබේ.



- වර්ණ තුනකින් පාට කර වේලා ගත් පොල් කුඩු හෝ ලී කුඩු හෝ සිහින් වැලි ඉහත ප්‍රදේශ තුනෙහි අලවන්න.
- එම ප්‍රදේශ නම් කරන්න.
- ඔබට දෙක ප්‍රශ්නයේ ආකාරයට නිර්මාණයක් දැක ගත හැක.

4. A. තැම්බූ බිත්තරයක් හරස් අතට කැපූ විට පෙනෙන අයුරු මෙම රූපයෙන් පෙන්වා දී ඇත.



බිත්තරයක කොටස් සමග පෘථිවියේ අභ්‍යන්තර ව්‍යුහය සසඳන්න . ඒ අනුව බිත්තරයේ පහත කොටස් වලට අනුරූප වන්නේ පෘථුවියේ කුමන කොටසද යන්න ලියන්න.

I. බිත්තර කහ මදය -
II. බිත්තර සුදු මදය -
III. බිත්තර කටුව -

B. ඔබ ගෙවත්තෙන් අලිගැටපේර ගෙඩියක් සපයා ගෙන රූපයේ පරිදි එය දෙකට වෙන් කරන්න.



පෘථිවියේ හරස්කඩක අඩංගු වන හරය, ප්‍රාවරණය හා කබොල යන ප්‍රදේශ අනුරූප වන්නේ අලිගැට පේර ගෙඩියෙහි කුමන කොටස් වලටද යන්න ලියන්න.

a. හරය -
b. ප්‍රාවරණය -
c. කබොල -

5. ඉහත සියලු ක්‍රියාකාරකම් වල නිරත වූ ඔබට පහතින් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සැපයිය හැක.

I. අප අයත් සෞරග්‍රහ මණ්ඩලයේ ඇති ග්‍රහලෝක ගණන කියද?
   a. හයයි
   b. හතයි
   c. අටයි
   d. නවයයි

II. සෞරග්‍රහ මණ්ඩලයේ පෘථිවියට අයත් වන ස්ථානය කියද?
   a. පළමු ස්ථානය
   b. දෙවන ස්ථානය
   c. තෙවන ස්ථානය
   d. සිව්වන ස්ථානය

III. පෘථිවි අභ්‍යන්තරය අධ්‍යයනයට තැම්බූ බිත්තරයක් දෙකට පලන ලදී. මෙහි බිත්තර කටුවෙන් ආදර්ශනය වන්නේ,
   a. පෘථිවි හරය යි .
   b. පෘථිවි ප්‍රාවරණය යි.
   c. පෘථිවි කබොල යි.
   d. පිටත හරය යි.

IV. පෘථිවි අභ්‍යන්තරය අධ්‍යයනයට අලිගැට පේර ගෙඩියක් දෙකට කපන ලදී. මෙහි අලිගැට පේර ගෙඩියේ මදයෙන් ආදර්ශනය වන්නේ,
   a. පෘථිවි කබොල යි.
   b. පෘථිවි ප්‍රාවරණය යි.
   c. පෘථිවි හරය යි.
   d. පිටත හරය යි.

V. පෘථිවියේ බාහිරයේ සිට අභ්‍යන්තරයට යන විට හඳුනා ගත හැකි ප්‍රදේශ පිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.
   a. කබොල, හරය, ප්‍රාවරණය
   b. ප්‍රාවරණය, කබොල, හරය
   c. හරය, ප්‍රාවරණය, කබොල
   d. කබොල, ප්‍රාවරණය , හරය